**හෝමියෝපති වෛද්‍ය සභාව - 2010**

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, හෝමියෝපති වෛද්‍ය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැවති තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.2 මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 සමාලෝචිත වර්ෂයේ පළමු මාස 07 ට අදාළ වියදම වූ රු.1,814,888 ක් අමාත්‍යාංශය විසින් දරා තිබූ අතර අවසන් මාස 05 ට අදාළ වියදම් වෛද්‍ය සභාව විසින් දරා තිබුණි.

1.2.2 ගිණුම්කරන අඩුපාඩු

-------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පසුගිය වර්ෂයට අදාළ රු.97,433 ක උපචිත වියදම් නොපියවා තිබියදී සමාලෝචිත වර්ෂයට අදාළ වියදම ගිණුමේ දක්වා එයින් උපචිත වියදම් හිලව් කිරීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේ වියදම සහ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) සේවක මණ්ඩල වැටුප් හා දීමනා ගිණුමේ එකතුව රු.1,590,040 ක් විය යුතු වුවද එම අගය රු.1,508,560 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ සේවක මණ්ඩල වැටුප් හා දීමනා වියදම රු.81,480 කින් අඩුවෙන් දැක්වුණු අතර වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඇ) වෛද්‍ය සභා රැස්වීම් දීමනා ලෙස ගෙවා තිබූ රු.15,000 ක් අත්තිකාරම් යටතේ සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම සහ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා ගෙවිය යුතු රු.42,000 ක් වූ ගණකාධිකරණ ගාස්තු උපචිත වියදම් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ඌනතාවයද, ජංගම බැරකම්ද අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ණය වාරික අයවීම් ලෙස වැටුපෙන් සහ ණය අත්තිකාරම්වලින් අඩුකර තිබුණ රු.108,486 ක මුදලක් හෝමියෝපති අරමුදල නමින් වියදම් ගිණුමක සාවද්‍ය ලෙස හර කර තිබුණු හෙයින් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දැක්වුණි.

(ඊ) සේවක ණය වාරික අයවීම් වලින් ලැබු රු.72,324 ක මුදලක් මුදල් පොත හර කර තිබූ අතර ඊට අදාල බැර සටහනට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(උ) දෙසැම්බර් මාසයේදි නිලධාරින්ගේ වැටුපෙන් අඩුකර ගත් 8% ක සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය වූ රු.19,979 ක් ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි.

(ඌ) වෛද්‍ය සභාවට එරෙහිව සේවයෙන් ඉවත් කළ සේවකයින් විසින් කම්කරු උසාවියේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබුණු අතර ඊට අදාල අසම්භාව්‍ය වගකීම මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

1.2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

සේවකයින් 7 දෙනෙක් සඳහා රු.50,000 බැගින් රු.350,000 ක ණයමුදලක් මාස 12 කින් අයකර ගැනිමේ පදනම මත 2009 වර්ෂයේදි ලබා දී තිබුණි. එයින් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය ලෙස රු.241,684 ක් විය.

1.2.4 හඳුනා නොගත් ශේෂ

------------------------

2009 වර්ෂයේ සිට දිගින් දිගටම පැවත එන රු.7,100 ක් වූ හඳුනා නොගත් ශේෂයක් බැංකු සැසඳුම්හි දක්වා තිබූ අතර එය හඳුනාගෙන සුදුසු පියවරක් ගැනීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි වුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| විවිධ ආදායම් | 35,303 | ලැබීම් කුවිතාන්සි |
| මුදල් ශේෂය- කොමර්ෂල් බැංකුව | 622,650 | බැංකු සනාථන |
| මුදල් ශේෂය - ලංකා බැංකුව | 418,413 | - එම- |
| ස්ථාවර වත්කම් (2008 වර්ෂයට පෙර මිලදී ගත් ) | 280,492 | උපලේඛන/ස්ථාවර වත්කම් ලේඛනය |

1.2.6 නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.1.1 හා 5.1.2 ඡේද | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 5.2.4 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහාද අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 6.5.3 ඡේදය | 2009 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2011 ජූනි 30 දින වන විටත් සභාගත කර නොතිබුණි. |
| (ආ) 2004 අගෝස්තු 10 දිනැති අංක පීඊඩී 25(1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් චක්‍රලේඛ විධිවිධානයන්හි සඳහන් නොවූ පෞද්ගලික බැංකුවක සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ මාස 05 ක කාලපරිච්ඡේදය තුළදී සභාවේ කටයුතු වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.382,792 ක ඌනතාවයක් විය. කෙසේ වුවත් වසරේ මුල් මාස 07 සඳහා අමාත්‍යාංශය විසින් රු.1,814,888 ක මුදලක් වෛද්‍ය සභාව සඳහා වැය කර ඇති අතර එම වටිනාකම මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. එයට එරෙහිව ඉකුත් වර්ෂයේ රු.2,424,091 ක අතිරික්තයක් විය.

2.2 කාර්යසාධනය

-----------------

(අ) 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 22 වගන්තියෙහි සඳහන් අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

i. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා අදාල පර්යේෂණ හා අධ්‍යයන ධෛර්යමත් කිරීම.

ii. හෝමියෝපත ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදා හැරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

iii. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු සම්පාදනය කරගෙන තිබුණද, වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාල නීතිමය රාමුව සකස් කර අදාල කාර්යය ඉටු කිරීමේ කටයුතු සිදු කිරීමට විගණිත දිනය වූ 2011 ජූනි 01 දින වනවිටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් පනතේ 27(3)(C) වගන්තිය ප්‍රකාර විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් 7 ක් තුල පවත්වාගෙන යනු ලබන හෝමියෝපති වෛද්‍ය සායන 7 කින් සායන 6 ක් සඳහාම රෝගී සහභාගිත්වය 2% සිට 47% දක්වා වූ පරාසයකින් අඩු වී ඇති බැව් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදි දරන ලද රු.2,994,386 ක් වූ මුළු පිරිවැයෙන් රු.844,000 ක් දරා තිබුණේ නීති ගාස්තු වෙනුවෙන් වූ අතර එය සමස්ථ වියදම සමග සැසඳීමේදී 28% ක අගයක් ගෙන තිබුණි.

2.3 හඳුනාගත් පාඩු

------------------

සේවක භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් නියමිත දිනට නොගෙවීම නිසා ගෙවීමට සිදු වූ දඩ මුදල රු.15,765 ක් විය.

2.4 නිෂ්කාර්ය වත්කම්

---------------------

හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් 2009 වර්ෂයේදී මිලදී ගත් රු.1,199,254 ක් වටිනා ස්ථාවර වත්කම් විගණිත දිනය වූ 2011 ජූනි 01 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුණි.

2.5 කළමනාකරණ දූර්වලතා

----------------------------

දීර්ඝ කාලයක් තුල පවතින ඉතා පැරණි හෝමියෝපති ඖෂධ වර්ග බොහොමයක් සභාව තුල පවතින අතර 2010 දෙසැම්බර් 07 දින සිදුකරනු ලැබූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඖෂධ සම්බන්ධයෙන් දැනුමක් ඇති පුද්ගලයෙකුද ඇතුලත් මණ්ඩලයක් පත්කොට රසායනික සංයුතිය වෙනස්වීමට ඉඩ ඇති අදාල ඖෂධ පරීක්ෂා කර නුසුදුසු තත්ත්වයේ ඇති ඖෂධ ඉවත් කිරීමට කටයුතු කළයුතු බවට දක්වා ඇතත් විගණිත දිනය වූ 2011 ජූනි 01 දින වනවිටත් ඒ සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වෛද්‍ය සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම.

(ආ) වාර්ෂික ගාස්තු ලේඛනයක් පැවැත්වීම